# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

## කර්මාන්ත හා ව්‍යවසායකත්ව හා සංවර්ධන අමාත්‍යාංශය

# තනතුරු පුරප්පාඩු

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් අතුරින් සුදුසුකම්ලත් හා අත්දැකීම් සහිත අපේක්ෂකයින් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. අධ්‍යක්ෂ (මූල්‍ය) (HM 1-1) - තනතුරු 01

**සුදුසුකම් හා පළපුරුද්ද**

අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ (ICASL) සාමාජිකත්වය හෝ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ සාමාජිකත්වය (CIMA) සහ සහතිකලත් සහ සංයුක්ත ගණකාධිකාරිවරුන්ගේ සංගමයෙහි සාමාජිකත්වය ලබා තිබීම (ACCA)

හෝ

ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය / කළමනාකරණය / වාණිජ්‍ය / ආර්ථික විද්‍යාව පිළිබඳ මූලික උපාධිය සහ කළමනාකරණ පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

ඇ) අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 15 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම

**වැටුප් පරිමාණය**

HM 1-1 රු. 140,640 - 4,100 x 15 - 202,140 + රජයේ අනුමත දීමනා හිමි වේ.

*(මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වනුයේ 2027.01.01 දින සිටය)*

**අතිරේක ප්‍රතිලාභ**

- PED චක්‍රලේඛ අංක 01/2015 යටතේ නිල ප්‍රවාහන පහසුකම් ලබාදෙනු ඇත.
- වෘත්තීය දීමනාව
- දුරකථන දීමනාව

**වයස :**

අවුරුදු 35 ට නොඅඩු සහ 50 නොවැඩි විය යුතුය. (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර)

## 02. සහකාර අධ්‍යක්ෂ (මෙහෙයවීම්) (MM 1-1) තනතුරු 01

**සුදුසුකම් හා පළපුරුද්ද :**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ව්‍යාපාර පරිපාලනය හෝ කළමනාකරණය / වාණිජ්‍ය / සංඛ්‍යානය පිළිබඳ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක වසර 03 ක පළපුරුද්ද.

ආ) පළමු හෝ දෙවන පෙළ පන්ති සාමාර්ථයක් ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය හිමි වේ.

ඇ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් වැඩ කිරීමට හැකිවීම අත්‍යවශ්‍යයි.

**වැටුප් පරිමාණය**

MM 1-1 - රු. 91,690 - 2,480 x 10 - 3,450 x 15 - 168,240 + රජයේ අනුමත දීමනා හිමි වේ.

*(මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වනුයේ 2027.01.01 දින සිටය)*

**අතිරේක ප්‍රතිලාභ**

- වෘත්තීය දීමනාව
- දුරකථන දීමනාව

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු සහ 45 නොවැඩි විය යුතුය. (අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර)

**අතිරේක ප්‍රතිලාභ**

- සේවක අර්ථසාධක / භාරකාරත්ව අරමුදලේ හිමිකම
- වාර්ෂික ලාභ මත ගෙවනු ලබන දිරි දීමනා
- සේවකයා සහ ඔහු / ඇයගේ පවුලේ අය සඳහා වෛද්‍යාධාර ප්‍රතිපූර්ණය
- ප්‍රවාහන දීමනා
- ත්‍යාග දීමනා
- නිවාස ණය පොලී සහ වෙනත් ණය පහසුකම්

ඉහත සියලු තනතුරු සඳහා අයදුම් කරන පුරවැසියන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි.

ඉහත තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන අයදුම්කරුවන් තම අයදුම්පත් ඔබ ගැන විස්තර ලබාගත හැකි ඥාති නොවන දෙදෙනෙකුගේ නම්, තනතුරු හා දුරකථන අංක අයදුම්පත්‍රයට ඇතුළත් කොට තම වෘත්තීය සහ අධ්‍යාපන සහතික සහ සේවා සහතිකවල, සහතික කරන ලද පිටපත්ද සමග සිය අයදුම්පත 2026.09.21 දින හෝ එදිනට පෙර අයදුම් කරනු ලබන තනතුරේ නම ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි සඳහන් කර **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී** වෙත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය.

රාජ්‍ය අංශයේ සේවය කරන අපේක්ෂකයින් සිය අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානින් මඟින් එවිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,**
**අංක 260, RTFC & WMC ගොඩනැගිල්ල, ලේක් ඩ්‍රයිව්, කොළඹ 05.**
**දුරකථන අංක - 011-2390645 / 011-2390646**
**ෆැක්ස් - 011-2320758**

Gazette.lk